# ආරක්‍ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය

ආරක්‍ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේ භාවිතයෙන් පසු ආයෝජ්‍ය කරන ලද පහත සඳහන් රථ වාහන ආරක්‍ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලයේදී ටෙන්ඩර් ක්‍රියාවලිය මගින් විකිණීමට ඉදිරිපත් කෙරේ.

ටෙන්ඩර් ක්‍රියාවලිය පිළිබඳ විස්තර හා අදාල ටෙන්ඩර් කොන්දේසි

01. ටෙන්ඩර් කාල සටහන (සති අන්ත දින හා රජයේ නිවාඩු දින හැර)

| වාහන/ පොදු භාණ්ඩ | රථ වාහන/පොදු භාණ්ඩ ලොට් අංක | අයදුම්පත් ඉදිරිපත් කල හැකි කාල සීමාව | ටෙන්ඩරය විවෘත කරන දිනය හා වේලාව | ආපසු ගෙවන ඇප තැන්පතු මුදල |
|---|---|---|---|---|
| එන්ජී 5801 මිට්ෂුබිසි එල් 300 වෑන් රථය | 01 | දින 09 ක් ඇතුලත | 2019 ජුනි 28 දින 0930 පැය | 20,000.00 |
| එල්ජී 8420 මිට්ෂුබිසි එල් 200 සිංගල් කැබ් රථය | 03 | | | 20,000.00 |
| එල්ජී 8419 මිට්ෂුබිසි එල් 200 සිංගල් කැබ් රථය | 04 | | | 15,000.00 |
| ටීඑස් 1409 ධාවන පැදිය | 06 | | | 4,000.00 |
| ටීඑස් 1404 ධාවන පැදිය | 07 | | | 1,000.00 |
| පීසී 5484 ටාටා ටෙල්කොලයින් ඩබල් කැබ් රථය | 02 | | | 10,000.00 |
| කේඑෆ් 3697 නිශාන් කාර් රථය | 05 | | | 15,000.00 |

02. ටෙන්ඩර් ක්‍රියාවලිය සඳහා ඉදිරිපත් කර ඇති වාහන පරීක්‍ෂා කිරීම හා අයදුම්පත් ලබාගත හැකි කාල සීමාව වනුයේ 2019 ජුනි මස 17 දින 0930 පැයේ සිට 2019 ජුනි මස 21 දින 1800 පැය දක්වා වේ. නිසි අයුරු සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් අයදුම්පත් ටෙන්ඩර් පෙට්ටිය වෙත බහාලිය හැකි අවසන් දිනය 2019 ජුනි මස 25 වන දින 1500 පැය වේ.

03. ටෙන්ඩර් අයදුම්පත් ආරක්‍ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය වෙතින් මිලදීගත හැක. ටෙන්ඩර් අයදුම්පත් සඳහා එක ලොට් එකක් වෙනුවෙන් ආපසු නොගෙවනු ලබන රු: 1,000.00 ක මුදලක් සහ ඉහත වගුවේ සඳහන් ආපසු ගෙවන ඇප තැන්පතු මුදල එම කාර්යාලය වෙත ගෙවා අවශ්‍ය ටෙන්ඩර් අයදුම්පත් ලබාගත හැක. ටෙන්ඩර් අයදුම්පත ඉදිරිපත් කිරීමේදි ටෙන්ඩර් අයදුම්පත් සහ ආපසු ගෙවනු ලබන ඇප තැන්පතු මුදල සඳහා මෙම විද්‍යාලය වෙතින් නිකුත් කරන ලද කුවිතාන්සියේ මුල් පිටපත අනිවාර්යයෙන් අමුණා ඉදිරිපත් කල යුතුය.

04. අයදුම්පත් ඉදිරිපත් කිරීමේදි රථ වාහනයන්හි අංකය අනිවාර්යයෙන්ම අයදුම්පතෙහි හා අයදුම්පත් බහාලන කවරයේ වම් ඉහල කෙළවරේ සටහන් කල යුතුය.

05. ටෙන්ඩර් පෙට්ටිය ආක්‍ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය වෙත පැමිණීමට ඇති සභාව පාර පිවිසිමෙහි ස්ථානගත කර ඇති මුරහලෙහි තබා ඇත. එය සතියේ වැඩ කරන දින වල (සති අන්ත හා රජයේ නිවාඩු දින හැර) උදෑසන 0900 පැයේ සිට 1600 පැය දක්වා නියෝජිතයෙකු භාරයේ තබා ඇත. අයදුම්පත් පෙට්ටියට බහාලීමට ප්‍රථම එම ස්ථානයේ සිටින නියෝජිත භාරයේ තබා ඇති රෙජිස්ටරයේ ලේඛණ ගත කර අදාල පෙට්ටියට බහාලිය යුතුය. අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් මණ්ඩල සභාපති, ආරක්‍ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය, සපුගස්කන්ද ලිපිනයට එවිය යුතුය.

06. සෑම අයදුම්පතක්ම නිසි අයුරු සම්පූර්ණ කර කවරයක බහා ඉහත දක්වා ඇති ස්ථානයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට 2019 ජුනි මස 25 දින 1500 පැයට ප්‍රථම පුද්ගලිකව බහාලීමට හෝ ලියාපදිංචි තැපෑලෙන් එවීමට කටයුතු කළ යුතුය. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය හා වේලාවට ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. අයදුම්පත් විවෘත කරන අවස්ථාව සඳහා අනන්‍යතාවය සහතික කළ හැකි ජාතික හැඳුනුම්පත/ විදේශ ගමන් බලපත්‍රය/ රියදුරු බලපත්‍රය සහිතව ගැණුම්කරු හෝ ගැණුම්කරු සහභාගි නොවන්නේ නම් ඔහු වෙනුවට බලය පවරන ලද නිත්‍යානුකූල ලිපියක් සහිතව නියෝජිතයෙකු අනිවාර්යයෙන්ම සහභාගි කරවීමට ක්‍රියා කල යුතුය.

08. ටෙන්ඩර් ක්‍රියාවලිය සබැඳිව ඉහත සඳහන් කොන්දේසි හා අයදුම්පත් වල දක්වා ඇති කොන්දේසි හොඳින් කියවා බලා තේරුම් ගෙන ඒවාට අනුකූලව ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කිරීම හා ක්‍රියාකිරීම අයදුම්කරුවන් සතු වගකීම බව අවධාරණය කරන අතර, ටෙන්ඩරය පිළිබද අවසාන තීරණය ටෙන්ඩර් මණ්ඩල සභාපති සතුවේ. මේ පිළිබඳ වැඩි විස්තර ආසේඅමාවි දුරකථන අංක: 011-2963792 වෙතින් හා ආරක්‍ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාල වෙබ් අඩවියෙන් ( www.dscsc.lk) යන වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

සේනාවිධායක
ආසේඅමාවි